**අම්බලන්ගොඩ නගර සභාව**

**ගාල්ල දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දින ද ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 29 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 ඔක්තෝබර් 28 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

### 1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව අම්බලන්ගොඩ නගර සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට අම්බලන්ගොඩ නගර සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගබඩාවේ ඉතිරිව තිබූ විදුලිය, ලිපිද්‍රව්‍ය හා සාමාන්‍ය තොග ආගණනය කර, මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

#### 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

**(අ) පිළිතුරු නොලත් විගණන විමසුම්**

2012 දෙසැම්බර් 31 දින වනවිට විගණන විමසුම් 24 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. එකී විමසුම්වලට භාජනය වූ ගනුදෙනුවල ගණනය කළහැකි වටිනාකම රු.18,408,982 ක් විය.

**(ආ) තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.77,745,450 ක් වූ ගනුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.17,259,764 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.15,180,338 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | **ආදායම් විෂයය** | **ඇස්තමේන්තුගත** | **තථ්‍ය** | **දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය** |
|---|---|---|---|---|
| | | රු.000' | රු.000' | රු.000' |
| (i) | වරිපනම් හා බදු | 7,330 | 7,187 | 10,469 |
| (ii) | බදු කුලී | 9,883 | 7,913 | 11,643 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,517 | 2,213 | 482 |
| (iv) | වෙනත් ආදායම් | 77,739 | 69,308 | 7,403 |

#### 2.2.2 හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂවල සභාවට අයකර ගතයුතුව තිබූ රු.9,311,660 ක් වූ වරිපනම් බදු රු.1,157,301 ක් වූ විනෝද බදු සහ රු.2,535,992 ක් වූ බදුකුලී නගර සභා ආඥාපනතේ 170 වගන්තිය ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 111,915 |
| (ii) | මුද්දර ගාස්තු | 36,707,095 |

## 2.2.4 හිඟහිටි එක්වන් මුදල්

සභාවට අයත් නව මාළු වෙළඳ සංකීර්ණයේ සහ ධීවර වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 10 කින් 2012 දෙසැම්බර් 31 දිනට රු.625,618 ක එක්වන් මුදල් අයවීමට තිබුණි.

## 2.2.5 1% බලපත්‍ර ගාස්තු අය නොකිරීම

නගර සභා ආඥා පනතේ 164 වගන්තිය ප්‍රකාරව සභා බලප්‍රදේශය තුළ පවත්වාගෙන යනු ලබන ලැගුම්හලකින් 2007 වර්ෂයේ සිට 1% ක බලපත්‍ර ගාස්තු අය කරගෙන නොතිබුණි.

## 2.2.6 කඩ කාමර බදු දීම

සභාවට අයත් ස.තො.ස. ගොඩනැගිල්ලේ කඩ කාමර 10 ක් බදුදීම පිළිබඳව 2013 මැයි 21 දින සිදු කරන ලද ස්ථානීය පරික්ෂාවේ දී පහත කරුණු නිරික්ෂණය විය.

(අ) අංක 05 දරන කඩ කාමරය බදුකරු විසින් රු.17,000 ක මාසික කුලියට වෙනත් පුද්ගලයෙකුට අතුරු බදු දී තිබුණි.

එමෙන්ම බදු ගැණුම්කරුවන් විසින් පහත සඳහන් කඩ කාමර විකුණා තිබුණි.

(i) 2009 මාර්තු 17 දින බදු ගෙන තිබූ අංක 08 දරන කඩ කාමරය 2009 මාර්තු 20 දින රු.1,100,000 කට වෙනත් අයෙකුට විකුණා තිබුණි.

(ii) කඩ කාමර අංක 06 හා 07 බදුකරුවන් විසින් කඩ කාමරයක් රු.1,100,000 බැගින් විකුණා තිබුණි. සභාව විසින් එකී ගැණුම්කරුවන් සමඟ නව ගිවිසුම් අත්සන් කර, අදාළ කඩ කාමර පවරා දී තිබුණි.

(ආ) කඩ කාමර අංක 02 ඉදිරියේ භාණ්ඩ ප්‍රදර්ශනය සඳහා රස්කර තිබුණි.

(ඇ) වර්ගඵලය වර්ග අඩි 367.2 – 397.5 දක්වා වූ කඩ කාමර අංක 03, 04, 05, 06 සහ 07 යන කඩකාමරවල බදු කුලිය රු.3,281 - රු.4,690 ක පරාසයක පැවතුණ ද, එම කඩ කාමරවලට වඩා තුන් ගුණයක් විශාල වර්ග ඵලය වර්ග අඩි 513.3 ක් වූ අංක 01 දරන කඩ කාමරය සඳහා රු.2,734 ක අඩු මාසික බදු කුලියක් අය කර තිබුණි. එමෙන්ම වර්ග අඩි 825 කින් යුතු රැස්වීම් ශාලාව එක්තරා පුද්ගලයෙකුට මාසිකව රු.1,034 ක් වූ අඩු බදු මුදලකට බදු දී තිබුණි.

කඩ කාමර අංක 02, 03, 04, 05, 06, 07 හා 08 සඳහා කාලය වසර 03 ඉක්ම ගොස් තිබුණ ද, නැවත ගිවිසුම් අළුත් කර නොතිබුණි.

**2.3 නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත භෞතික සම්පත්**

**--------------------------------------------------**

සභාව සතු අංක 37 ශ්‍රී 1877 දරන ට්‍රැක්ටරය 2008 වර්ෂයේ සිට විගණන දිනය වූ 2013 මැයි 23 දින දක්වා නිශ්ක්‍රීයව පැවතුණි. එය අළුත්වැඩියා කිරීමට හෝ අළුත්වැඩියා කළ නොහැකි තත්ත්වයේ පවතින්නේ නම් අපහරණය කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

**2.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**----------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**2.4.1 වීථි පහන් සඳහා වූ වියදම් ප්‍රතිපූර්ණය කර නොගැනීම**

**------------------------------------------------------------**

2012 වර්ෂය තුළ වීථි පහන් උපකරණ මිළදී ගැනීම වෙනුවෙන් රු.735,020 ක් වැයකර තිබූ අතර, වීථි පහන් නඩත්තුව සඳහා රු.806,484 ක් වැයකර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) වීථි පහන් අළුතින් ස්ථාපිත කිරීමට පෙර විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයෙන් අනුමැතිය ලබා ගැනීමකින් තොරව වීථි පහන් සවි කර තිබුණි.

(ii) 2012 වර්ෂය සඳහා ලංකා විදුලි පුද්ගලික සමාගම සමඟ ගිවිසුම් අත්සන් කර තිබුණ ද, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් කිසිදු දීමනාවක් සභාවට ලැබී නොතිබුණි.

(iii) බලප්‍රදේශයේ නඩත්තු කරන වීථි පහන් පිළිබඳ විස්තර දැක්වෙන ලේඛනයක් සකස් කර නොතිබුණි.

### 2.4.2 සිසිලස ගාර්ඩන් ඉඩම් වෙන්දේසිය

අම්බලන්ගොඩ නගර සභා බලප්‍රදේශයේ අම්බලන්ගොඩ බටපොල පාරේ ගොඩහේන ග්‍රාමයේ අක්කර 1 රූඩ් 2 යි පර්චස් 4.26 ක් විශාල වූ පල්ලෙතොට බැද්ද නම් වූ ඉඩම කැබලි කර විකිණීමට එක්තරා පුද්ගලික සමාගමක් වෙත 2007 අගෝස්තු 08 දින අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාව විසින් සංවර්ධන බලපත්‍රයක් ලබා දී තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) කැබලි කරන ලද ඉඩම සඳහා 2007 ඔක්තෝබර් 22 දින අනුකූලතා සහතිකය ද අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාව විසින් ලබා දී තිබුණි.

(ii) විකුණන ලද ඉඩම් කැබලි සඳහා 1% බදු ලෙස රු.81,384 ක් 2007 ඔක්තෝබර් 19 දින අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාව විසින් අය කරගෙන තිබුණි.

(iii) විකුණන ලද ඉඩම් කැබලි දෙකක නිවාස ඉදිකර පදිංචි වී සිටි අතර, තවත් කැබලි දෙකක නිවාස දෙකක් ඉදි කරමින් පැවතුණ බව 2013 මැයි 23 දින සිදුකල ස්ථානීය පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය.

(iv) අම්බලන්ගොඩ නගර සභා බලප්‍රදේශයට අයත් මෙම ඉඩමට ප්‍රාදේශීය සභාව විසින් සංවර්ධන බලපත්‍රයක් ලබාදීම සම්බන්ධයෙන් හා ප්‍රාදේශීය සභාව විසින් අය කරගන්නා ලද 1% බදු මුදල ආපසු අයකර ගැනීම සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

### 2.4.3 නාගරික සංවර්ධන අධිකාරියට ගෙවිය යුතු ණය

---

(i) ට්‍රැක්ටර් 03 මිළදී ගැනීම සඳහා 1998 අප්‍රේල් 06 දින ලබාගෙන තිබූ රු.1,200,463 ක ණය මුදල සඳහා කිසිදු ණය වාරික මුදලක් ගෙවා නොතිබුණු අතර, 2012 දෙසැම්බර් 31 වනවිට හිඟ ණය වාරික මුදල රු.720,277 ක් වූ අතර, ගෙවිය යුතුව තිබුණු පොළී මුදල රු.1,319,902 ක් විය.

(ii) ට්‍රේලර් 03 මිළදී ගැනීම සඳහා 1998 ජුනි 04 දින ලබාගෙන තිබූ රු.115,200 ක ණය මුදල සඳහා කිසිදු ණය වාරික මුදලක් ගෙවා නොතිබුණු අතර, 2012 දෙසැම්බර් 31 වනවිට හිඟ ණය වාරික මුදල රු.69,120 ක් වූ අතර, ගෙවිය යුතුව තිබුණු පොළී මුදල රු.124,403 ක් විය.

(iii) බස් නැවතුම්පල ව්‍යාපෘතිය සඳහා 1998 දෙසැම්බර් 31 දින ලබාගෙන තිබූ රු.32,542,135 ක ණය මුදල සඳහා 2012 දෙසැම්බර් 31 දින වනවිට රු.14,719,631 ක ණය වාරික හා රු.21,044,088 ක පොළී ගෙවිය යුතුව තිබුණි.

**2.4.4 සැලසුම්**

2010 මාර්තු 10 දිනැති හා අංක PF/R/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වරයාගේ ලිපිය ප්‍රකාරව අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**2.5 අභ්‍යන්තර විගණනය**

ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් ද සිදුකර නොතිබූ අතර 2006 අගෝස්තු 28 දිනැති හා අංක : PE/F/S/4(xiii) දරන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා නොතිබුණි.

**3. පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය